# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය
# ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යාංශය
# දුම්රිය කාර්යක්ෂමතාවය ඉහළ නැංවීමේ ව්‍යාපෘතිය
# ව්‍යාපෘති කාර්ය මණ්ඩල පුරප්පාඩු

මෙම අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන දුම්රිය කාර්යක්ෂමතාවය ඉහළ නැංවීමේ ව්‍යාපෘතිය විසින් ව්‍යාපෘති කාර්ය මණ්ඩලය බඳවා ගැනීම සඳහා ශ්‍රී ලංකා රජයේ මුදල් සැලසුම් හා ආර්ථික කටයුතු අමාත්‍යාංශයේ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද 02/2026 දරන චක්‍රලේඛයේ කොන්දේසිවලට අනුකූලව කොන්ත්‍රාත් පදනම මත පහත සඳහන් පුරප්පාඩු තනතුරු සඳහා සුදුසුකම් ලත් ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් මෙයින් කැඳවනු ලැබේ.

දුම්රිය කාර්යක්ෂමතාවය ඉහළ නැංවීමේ ව්‍යාපෘතිය ආසියානු සංවර්ධන බැංකු ණය යටතේ මෙම අමාත්‍යාංශය සහ ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව එක්ව ක්‍රියාත්මක කරනු ලබයි.

| අංක | තනතුර | වැටුප් කේතය | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|
| 1. | නියෝජ්‍ය ව්‍යාපෘති අධ්‍යක්ෂ (ඉඩම් අත්පත් කර ගැනීම) | B | 01 |
| 2. | නියෝජ්‍ය ව්‍යාපෘති අධ්‍යක්ෂ (ඉංජිනේරු) | B | 01 |
| 3. | නියෝජ්‍ය ව්‍යාපෘති අධ්‍යක්ෂ (අධීක්ෂණය හා ඇගයීම්) | B | 01 |
| 4. | ප්‍රසම්පාදන විශේෂඥ | C | 01 |
| 5. | සහකාර ව්‍යාපෘති අධ්‍යක්ෂ (ඉඩම්) | C | 01 |
| 6. | සහකාර ව්‍යාපෘති අධ්‍යක්ෂ (සමාජ ආරක්ෂණ) | C | 01 |
| 7. | සහකාර ව්‍යාපෘති අධ්‍යක්ෂ (ඉංජිනේරු) - (ක.සේ.ච.02/2026 හි D ඛාණ්ඩයේ ඉංජිනේරු III යටතේ) | D | 01 |
| 8. | ජ්‍යෙෂ්ඨ සමාජ ආරක්ෂණ නිළධාරී | E | 02 |
| 9. | සමාජ ආරක්ෂණ නිලධාරී | F | 02 |
| 10. | ඉඩම් නිලධාරී | F | 01 |

| වැටුප් කේතය හා තනතුරු නාම | **අවශ්‍ය මූලික සුදුසුකම්** |
|---|---|
| **B**<br>**නියෝජ්‍ය ව්‍යාපෘති අධ්‍යක්ෂ තනතුරු නාම සඳහා** | පහත අනු අංක 01, 02 හෝ 03 අතුරින් එක් සුදුසුකමක්.<br>01. අදාළ ක්ෂේත්‍රයේ උපාධියක්<br>සහ<br>අදාළ ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධියක් / අදාළ ක්ෂේත්‍රයේ පිළිගත් වෘත්තීමය ආයතනයකින් ලබාගත් ආශ්‍රිත සාමාජිකත්වයක් / සමාන වෘත්තීමය සුදුසුකමක්<br>සමග<br>අදාළ ක්ෂේත්‍රයේ කළමනාකරණ මට්ටමේ අවම වශයෙන් වසර 11ක සේවා පළපුරුද්දක් ලබා තිබීම, ඉන් වසර 5ක් ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ විය යුතුය.<br><br>02. අදාළ ක්ෂේත්‍රයේ පිළිගත් වෘත්තීමය ආයතනයකින් ලබාගත් සාමාජිකත්වයක්.<br>සමඟ<br>අවම වශයෙන් කළමනාකරණ මට්ටමේ වසර 9ක පළපුරුද්දක් ලබා තිබීම, ඉන් වසර 4ක් ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ විය යුතුය.<br><br>03. රජයේ දීපව්‍යාප්ත සේවාවක I පන්තියේ නිලධාරියකු වීම / අදාළ ක්ෂේත්‍රයේ සමාන සුදුසුකම් ලබා තිබීම<br>සහ<br>අදාළ ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධි සුදුසුකමක් / පිළිගත් වෘත්තීයමය ආයතනයක ආශ්‍රිත සමාජිකත්වය හෝ සමාන වෘත්තීයමය ආයතනයක වෘත්තීයමය සුදුසුකමක් ලබා තිබීම.<br>සමග<br>I පන්තියේ තනතුරක අවම වශයෙන් වර්ෂ 4ක සේවා පළපුරුද්දක් ලබා තිබීම හෝ අදාළ ක්ෂේත්‍රයේ සමාන සුදුසුකම් ලබා තිබීම. |
| **C**<br>**ප්‍රසම්පාදන විශේෂඥ, සහකාර ව්‍යාපෘති අධ්‍යක්ෂ (සමාජ ආරක්ෂණ),සහ සහකාර ව්‍යාපෘති අධ්‍යක්ෂ (ඉඩම්) යන තනතුරු සඳහා** | පහත අනු අංක 1 හෝ 2 අතරින් එක් සුදුසුකමක්<br>01. අදාළ ක්ෂේත්‍රයේ උපාධියක්<br>සහ<br>අදාළ ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධියක් / පිළිගත් වෘත්තියමය ආයතනයක ආශ්‍රිත සාමාජිකත්වය ලබා තිබීම<br>සමග<br>අදාළ ක්ෂේත්‍රයේ කළමනාකරණ මට්ටමේ වසර 10 ක පළපුරුද්ද<br><br>02. රජයේ දීප ව්‍යාප්ත සේවාවක I පන්තියේ නිලධාරියෙකු වීම හෝ ක්ෂේත්‍රයට අදාල සමාන මට්ටමේ නිලධාරියෙකු වීම<br>සහ<br>අදාළ ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධි සුදුසුකමක්<br>සමඟ<br>I පන්තියේ අවම වශයෙන් වසර 03ක පළපුරුද්ද හෝ ක්ෂේත්‍රයට අදාළ සමන් මට්ටමේ සුදුසුකමක් ලබා තිබීම |

| | |
|---|---|
| **D බාණ්ඩයේ ඉංජිනේරු III යටතේ වන තනතුර සඳහා පමණි.** | පහත අනු අංක 01 පමණි<br><br>01.අදාළ ක්ෂේත්‍රයේ උපාධියක් / ක්ෂේත්‍රයට අදාළ විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන සමාන සුදුසුකමක් තිබීම.<br>සහ<br>ආශ්‍රිත සාමාජිකත්වය / පිළිගත් වෘත්තීය ආයතනයකින් ලබාගත් සමාන සුදුසුකමක් තිබීම. |
| **E**<br>**ජ්‍යෙෂ්ඨ සමාජ ආරක්ෂණ නිලධාරී** | පහත අනු අංක 1,2 හෝ 3 අතරින් එක සුදුසුකමක්<br><br>01. අදාළ ක්ෂේත්‍රයේ උපාධියක් / අදාළ ක්ෂේත්‍රයේ ප්‍රථම උපාධියකට සමාන සුදුසුකමක් ලෙස විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවෙන් පිළිගත් සුදුසුකමක් තිබීම.<br>හෝ<br>තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව පිළිගනු ලබන, තාක්ෂණ/ වෘත්තීය පුහුනු මධ්‍යස්ථානයකින් නිකුත් කරනු ලබන ජාතික වෘත්තීය කුසලතා (NVQ) 7 මට්ටමට නොඅඩු ප්‍රවීණතාවය පිළිබද සහතිකයක් ලබා තිබීම.<br>සහ<br>අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වර්ෂ 4 ක පළපුරුද්දක් ලබා තිබිය යුතුය.<br><br>02. තෘතියික හා වෘත්තීය හෝ අධ්‍යාපන කොමිෂන් සභාව පිළිගනු ලබන, තාක්ෂණ/ වෘත්තීය පුහුනු මධ්‍යස්ථානයකින් නිකුත් කරනු ලබන ජාතික වෘත්තීය කුසලතා (NVQ) 6 මට්ටමට නොඅඩු ප්‍රවීනත්වය පිළිබද සහතිකයක් ලබා තිබීම.<br>සහ<br>අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වර්ෂ7 ක පළපුරුද්දක් ලබා තිබිය යුතුය.<br><br>03. තෘතියික හා වෘත්තීය හෝ අධ්‍යාපන කොමිෂන් සභාව පිළිගනු ලබන, තාක්ෂණ/ වෘත්තීය පුහුනු මධ්‍යස්ථානයකින් නිකුත් කරනු ලබන ජාතික වෘත්තීය කුසලතා (NVQ) 5 මට්ටමට නොඅඩු ප්‍රවීනත්වය පිළිබද සහතිකයක් ලබා තිබීම.<br>සහ<br>අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වර්ෂ 10ක පළපුරුද්දක් ලබා තිබිය යුතුය. |
| **F**<br>**සමාජ ආරක්ෂණ නිලධාරී සහ ඉඩම් නිලධාරී** | පහත අනු අංක 01, 02 හෝ 03 අතුරින් එක් සුදුසුකමක්.<br><br>01. විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන ක්ෂේත්‍රයට අදාල උපාධියක් ලබා තිබීම.<br>හෝ<br>තෘතියික සහ වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන තාක්ෂණික / වෘත්තීය පුහුණු මධ්‍යස්ථානයකින් නිකුත් කරනු ලබන ජාතික වෘත්තීය කුසලතා (NVQ) 7 මට්ටමට නොඅඩු ප්‍රවීණතාවය පිළිබද සහතිකයක් ලබා තිබීම.<br>සමඟ<br>අදාල ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර 03ක සේවා පළපුරුද්දක් ලබා තිබීම.<br><br>02. තෘතියික සහ වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව පිළිගනු ලබන තාක්ෂණික / වෘත්තීය පුහුණු මධ්‍යස්ථානයකින් නිකුත් කරනු ලබන ජාතික වෘත්තීය කුසලතා (NVQ) 6 මට්ටමට නොඅඩු ප්‍රවීණතාවය පිළිබද සහතිකයක් ලබා තිබීම.<br>සමග<br>අදාල ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර 06ක සේවා පළපුරුද්දක් ලබා තිබීම. |

| | |
|---|---|
| | 03. තෘතියික සහ වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව පිළිගනු ලබන තාක්ෂණික / වෘත්තීය පුහුණු මධ්‍යස්ථානයකින් නිකුත් කරනු ලබන ජාතික වෘත්තීය කුසලතා (NVQ) 5 මට්ටමට නොඅඩු ප්‍රවීණතාවය පිළිබඳ සහතිකයක් ලබා තිබීම.<br>සමග<br>අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර 09ක සේවා පළපුරුද්දක් ලබා තිබීම. |

**වැටුප් පරාසය**

B – 370,000 – 390,000
C – 305,000 – 325,000
D – 180,000 - 200,000 (Engineer III)
E – 190,000 – 205,000
F – 160,000 – 175,000

**පොදු කොන්දේසි**

1. ඉහත දක්වා ඇති පුරප්පාඩු තනතුරු සඳහා ඉදිරිපත් වන අයදුම්කරුවන්ගේ වයස අවුරුදු 64ට අඩුවිය යුතුය.

2. සියලුම බඳවා ගනු ලබන්නන් අදාළ රාජ්‍ය සංවිධාන සහ වෙනත් ආයතන සමඟ සම්බන්ධීකරණ කටයුතු කරමින් සිය රාජකාරී ඉටුකරනු ඇතැයි අපේක්ෂා කෙරේ.

3. විදේශ ආධාර මත ක්‍රියාත්මක වන ව්‍යාපෘතිවල සේවා පළපුරුද්ද අමතර වාසියක් වනු ඇත.

4. ඉංග්‍රීසි භාෂා ප්‍රවීණතාවය, රජයේ රෙගුලාසි පිළිබඳ පළපුරුදු බව සහ පරිගණක සාක්ෂරතාවය ඉහත තනතුරු සඳහා අත්‍යාවශ්‍ය පූර්ව සුදුසුකම් වේ.

5. රාජ්‍ය අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල සහ ආයතනවල සේවකයින්ගේ අයදුම්පත් තෝරා ගනු ලැබුවහොත් අපේක්ෂකයා නිදහස් කළ හැකිද යන්න සෘජුව සඳහන් කරමින් අදාළ ආයතන ප්‍රධානීන් මගින් යොමු කළ යුතුය.

6. කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු චක්‍රලේඛ අංක 02/2026 අනුව දීමනා සමග වැටුප් ගෙවනු ලැබේ. සේවකයා මාසික වැටුපෙන් 8%ක්, සේවක අර්ථ සාධක අරමුදලට දායක වන අතර සේවායෝජකයා 12%ක් සේවක අර්ථසාධක අරමුදලට සහ 3%ක් සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදලට දායක වේ.

**අයදුම්පත්**

7. සුදුසුකම් ලත් අයදුම්කරුවන්, අදාළ තනතුරු සඳහා ඔවුන්ගේ යෝග්‍යතාව / සුදුසුකම් පෙන්වා දෙන ආවරණ ලිපියක් සමග, ඥාතිත්වයක් නොමැති නිර්දේශකයින් දෙදෙනකුගේ නම් සහ සම්බන්ධතා තොරතුරු ඇතුළත් සම්පූර්ණ කරන ලද ජීවදත්ත සටහනක් සහ අදාල අධ්‍යාපනික, වෘත්තීය සහ පළපුරුද්ද පිළිබඳ සහතිකවල සහතික කළ පිටපත් සමඟ අයදුම්පත් එවන ලෙස ඉල්ලා සිටිනු ලැබේ. එසේ නොමැති නම්, අදාළ අයදුම්පත් තෝරාගැනීම සඳහා සලකා බලනු නොලැබේ.
8. අයදුම්කරුවන් සෑම තනතුරක් සඳහාම වෙන වෙනම අයදුම්පත්, ඔවුන්ගේ අධ්‍යාපනික, වෘත්තීය සුදුසුකම් සහ පළපුරුද්ද දැක්වෙන ජීවදත්ත සටහනක් සහ ඥාතිත්වයක් නොමැති නිර්දේශකයින් දෙදෙනෙකුගේ සම්බන්ධතා තොරතුරු සමඟ 2026 අගෝස්තු 10 දින හෝ ඊට පෙර පහත ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවන ලෙස ඉල්ලා සිටිනු ලැබේ. කරුණාකර අයදුම්පත් කරන තනතුර ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරේ සඳහන් කරන්න.

**තැපැල් ලිපිනය:- ව්‍යාපෘති අධ්‍යක්ෂ, ව්‍යාපෘති කළමනාකරණ ඒකකය, කොළඹ තදාසන්න දුම්රිය ව්‍යාපෘතිය, කොටා පාර, කොළඹ 08.**

9. ඉහළම සුදුසුකම් සහ පළපුරුද්ද මත කෙටි ලැයිස්තුගත කළ අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයක් සඳහා කැඳවනු ලබන අතර කුසලතා මත තෝරා ගැනීම සිදු කෙරේ.

ලේකම්.
ප්‍රවාහන, මහාමාර්ග හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය
07 වන මහල, සෙත්සිරිපාය II අදියර
බත්තරමුල්ල.